# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,264 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 16 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 19 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 20 |


***සැ. යු.*** - ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 පෙබරවාරි මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

15- B 082309 — 353 (2022/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## මාරවිල දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියයි

නඩු අංකය : 139/MB
ස්වාභාවය : උකස්කරය
වටිනාකම : රු.1,419,638.89
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය, ඇත්තා වූ සහ නාත්තන්ඩිය, මාරවිල පාරේ අංක 62 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

මහවැව, මැද මහවැව,
අංක 176/A දරන ස්ථානයේ,
බ්‍රහ්ම ආචාරිගේ රොෂාන් මනෝජ් රන්ජන්

.....................*විත්තිකරු.*

වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 12 වන දින ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව, රුපියල් දාහතර ලක්ෂ දහනව දහස් හයසිය තිස් අටයි ශත අසූ නවයක (රු.14,19,638.89) මුදලක් සහ රුපියල් දස ලක්ෂ හැට අට දහස් හයසිය පනහක (රු. 10,68,650.00) ක මුදල මත සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 20% බැගින් පොලිය ද, නඩු ගාස්තු ද, ගෙවීම විත්තිකරු විසින් පැහැර හැර ඇති බැවින් එම මුදල අයකර දීම සඳහා ඉහල මහ වැව ග්‍රාමයේ පිහිටි පර්චස් දහ අටයි දශම දෙකයි හයක් (අ. 0, රූ. 0, පර්. 18.26) විශාල මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම,

වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින පෙ.ව. 10.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත, දකුණු පිටිගල් කෝරළේ, යටකළන්පත්තුවේ. ඉහල මහවැව ග්‍රාමයේ පිහිටි කලහගහවත්තේ අංක 1 A බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති, බෙදා වෙන් කොට සීමා නිර්ණය කර තිබෙන බිම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ සියල්ල සහිතවයි. බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් මැන සාදන ලද අංක 6636 සහ 2005.12.21 වැනි දින දරන පිඹුර අනුව එකී බිම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු ජී. පණ්ඩිතසේකර විසින් මැන සාදන ලද අංක 2101 දරන පිඹුරේ D බිම් කැබැල්ල, නැගෙනහිරට : පාර, දකුණට : බලයලත් මිනින්දෝරු ජී. එච්. ඊ. මැන්දිස් විසින් මැන සාදන ලද අංක 59/1990 දරන පිඹුරේ අංක 02 බිම් කැබැල්ල, බස්නාහිරට : එකී පිඹුරේ අංක එක 1B බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය පර්චස් දහ අටයි දශම දෙකයි හයක් (අ. 0, රූ. 0, පර්. 18.26) වේ.

*ඉඩමට පිවිසීම.*- කොළඹ හලාවත ප්‍රධාන බස් මාර්ගයේ මහවැව ඔරලෝසු කණුව ළඟින් තොඩුවාව දෙසට විහිදෙන මාර්ගයේ මීටර් 250 ක් පමණ ගොස් වී හේන මාර්ගයට පිවිස එම මාර්ගයේ මීටර් 75 ක් පමණ ගොස් පළමුවෙන්ම හමුවන වම් දෙසට පිහිටි අතුරු මාර්ගයේ මීටර් 50 ක් පමණ යනවිට එම අතුරු මාර්ගයට මුහුණලා දකුණු පසින් පිහිටා ඇත.

*විමසීම්.*- මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් - 032-2254291
(වෙන්දේසිකරු : 076-3230964)

ටී. එම්. සේනාරත්න,
අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු, හා තක්සේරුකරු විශ්‍රාම ලත්,
අධිකරණ රෙජිස්ට්‍රාර්/පිස්කල්/ප්‍රොබේෂන් නිළධාරී,
මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාර,
ජය මාවත, නාත්තන්ඩිය පාර, මාරවිල.

01-157

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

**පිස්කල් වෙන්දේසියයි**

කොළඹ 03, ගාළු පාරේ, අංක 450 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ''වෙන්නප්පුව ශාඛාව'' යනුවෙන් හඳුන්වන ලබන ශාඛා කාර්යාලයක් වෙන්නප්පුව හලාවත පාරේ අංක 06 දරන ස්ථානයේ පිහිටා ඇති පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී (Pan Asia Banking Corporation PLC)

නඩු අංකය : MB263
වටිනාකම : රු. 3,696,966.90
ස්වාභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

.......................*පැමිණිලිකරු.*

*එදිරිව*

සුසන්ත වැන්ඩර්ලන්,
අංක 07,
සමගි මාවත,
කොලින් ජාඩිය,
වෙන්නප්පුව.

..............................*විත්තිකරු.*

වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 23 වන දින සමථ තීන්දු ප්‍රකාශය අනුව (අ) රුපියල් විසි ලක්ෂ දොලොස් දහස් දෙසිය හැට තුනයි ශත අනූ අට (රු. 20,12,263.98) ක මුදලක් සහ 2016.02.09 දින සිට රු. 19,09,629.26 ක මුදල මත වර්ෂයකට 15.5% ක් වූ පොලිය ද, (ආ) රුපියල් දහසය ලක්ෂ අසූ හතර දහස් හත්සිය දෙකයි ශත අනූ දෙක (රු. 16,84,702.92) ක මුදලක් සහ 2016.02.09 දින සිට රු. 16,75,911.26 ක මුදලක් මත වර්ෂයකට 24% ක් වූ අනුපාතයක් මත පොලියක් ද නඩු තීන්දුවේ දිනය වූ 2018.01.23 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදල මත නෛතික පොලිය ද, ගෙවීම විත්තිකරු පැහැර හැර ඇති බැවින් එම මුදල අය කර දීම සඳහා කොලින්ජාඩිය උතුර අංක 493 බී දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොලින්ජාඩිය ග්‍රාමයේ පිහිටි රූඩ් එකයි පර්චස් නමයයි දශම පහක් (අක්. 0, රූ. 01, පර්. 9.5) ක් විශාල මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම,

වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 10.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, (මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) පිටිගල් කෝරළේ දකුණේ, කම්මල් පත්තුවේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොලින්ජාඩිය උතුර අංක 493 බී දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොලින්ජාඩිය ග්‍රාමයේ පිහිටි ලෝලුගහවත්ත සහ සියඹලාගහවත්ත නමැති ඉඩම බෙදා වෙන් කළ ලොට් 02 දරන කැබැල්ල නමැති, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් මැන සාදන ල 2014.11.20 දිනැති අංක 12398 දරන පිඹුරේ දැක්වෙන, උතුරින් : එම්. එච්. ඩේවිඩ් ආතර් අප්පුහාමි සතු ඉඩම ද, නැගෙනහිරින් : වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු ඉඩම ද, දකුණින් : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරින් : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද පිඹුරු අංක 7781 හි ලොට් 1 ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම පහ (අ. 0, රූ. 1, පර්. 9.5) ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ අනෙකුත් සියලු දෙය වේ.

*ඉඩමට පිවිසීම*.- කොළඹ -හලාවත ප්‍රධාන බස් මාර්ගයේ මාරවිල සිට වෙන්නප්පුව දෙසට යනවිට ආදම් හන්දියෙන් වමට හැරී සුසේ මාවතේ මීටර් 350 ක් පමණ යනවිට එම පාරට යාබදව වම් පසින් පිහිටා ඇත.

*විමසීම්*.- මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් - 032-2254291
(වෙන්දේසිකරු 076-3230964)

ටී. එම්. සේනාරත්න,
අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු හා තක්සේරු කරු විශ්‍රාම ලත්,
අධිකරණ රෙජිස්ට්‍රාර්/පිස්කල්/ප්‍රොබේෂන් නිළධාරී,
මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාර,
ජය මාවත, නාත්තන්ඩිය පාර, මාරවිල.

01-158

## මාරවිල දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියයි

සීමාසහිත සමගි එස්ටේට් ඇන්ඩ් ෆිනෑන්ස් පුද්ගලික සමාගම, අංක 1/56 හි, හලාවත පාර, වෙන්නප්පුව.

..................පැමිණිලිකරු.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 125/එම්. බී. |
| වර්ගය | : | උකස් |
| වටිනාකම | : | රු. 46,24,800 |
| ක්‍රියා පටිපාටිය | : | ලඝු |

එදිරිව

වීරක්කොඩි ආරච්චිගේ දෝන ග්‍රේස් අයිරින් පැට්‍රීසියා
(කුරුකුලසූරිය ලලීන්ද්‍ර ප්‍රදීප් ලූෂන් ප්‍රනාන්දු යන අයගේ ඇටර්නි බලකරු)
නො. 175,
බන්ඩිරිප්පුව පාර,
හාල්දඬුවන, ලුණුවිල.

.....................විත්තිකාරිය.

වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සමථ තීන්දු ප්‍රකාශය අනුව 2013.04.15 වැනි දිනය වන විට ලැබිය යුතු පොලී මුදල වන රුපියල් විසි අට ලක්ෂ හැට දෙදහස් තුන්සියයක (රුපියල් 28,62,300) මුදලක් ද, ඒ දිනය වන විට ණය මුදලින් ගෙවීමට අපොහොසත් වූ ණය මුදලේ ශේෂය වූ රුපියල් දාහත් ලක්ෂ හැට දෙදහස් පන්සියයක් (රු. 17,62,500) ද ඇතුළුව රුපියල් හතලිස් හය ලක්ෂ විසිහතර දහස් අටසියයක (රු. 46,24,800.00) ක මුදල ද පැමිණිල්ලේ දිනය වූ 2013.09.17 වැනි දින සිට එකී මුදල අයකර ගන්නා දිනය දක්වා නෛතික පොලිය ද, නඩු ගාස්තු ද ගෙවීම විත්තිකාරිය පැහැර හැර ඇති බැවින් එම මුදල අය කර දීම සඳහා මාරවිල ගමේ කුරුස පල්ලිය අසල පිහිටි පර් 32.5 ක් විශාල, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම,

වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින සිට පෙ.ව. 10.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරළේ, යටකලන්පත්තුවේ මාරවිල නම් ගමේ පිහිටි කහට ගහ වත්ත *හෙවත්* නෙරිය ඩී 176 නම් ඉඩමට, එස්. පී. රණසිංහ බලය ලත් මානක තැන 2001.06.02 වන දින මැන සාදන ලද අංක 1077/ඒ දරන පිඹුර ප්‍රකාරව දැක්වෙන ලොට් 4 දරන ඉඩම් කොටස වන, උතුරට : අංක 1077 දරන පිඹුරේ ලොට් 13 දරන පාරකට වෙන් කර ඇති බිම් තීරයද, නැගෙනහිරට : අංක 1077 දරන පිඹුරේ ලොට් 67 දරන ඉඩම් කොටස ද, දකුණට : ලොට් 05 ද, බස්නාහිරට : ලොට් 06 ද, මායිම් වන පර්චස් දාසයයි දශම දෙකයි පහක් (අක්. 0, රූ. 0, පර්. 16.25) පමණ විශාල ඉඩම් කොටස සහ ඒ තුල පිහිටි සෑම සියළු දේද සහ ඉහත කී පිඹුරේම ලොට් 05 දරන ඉඩම් කොටස වන, උතුරට : ලොට් 04 ද, නැගෙනහිරට : අංක 1077 දරන පිඹුරේ ලොට් 67 ද, දකුණට : එම්. ඒ. ජේ. පී. ප්‍රනාන්දුට අයිති ඉඩම ද, බස්නාහිරට : ලොට් 06 ද, මායිම් වන පර්චස් දසයයි දශම දෙකයි පහක් (අ. 0, රූඩ්. 0, පර්. 16.25) පමණ විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද සමග වේ. එම ඉඩම් කොටස් දෙක එක්ව එක් ඉඩම් කැබැල්ලක් වශයෙන් පර්චස් 32.5 ක් විශාල වේ.

*ඉඩමට පිවිසීම.-* කොළඹ පුත්තලම පාරේ මාරවිල හන්දියෙන් කුරුස පල්ලිය පාරේ කි. මී. 2ක් පමණ යන විට මුහුදුබඩ මාර්ගය හමුවේ. කුරුස පල්ලිය ළඟ හන්දියෙන් හලාවත දෙසට හැරී මීටර් දෙසීයක් පමණ යන විට එම පාරේ දකුණු පසින් එම පාරට යාබදව පිහිටා ඇත. ඉඩමේ සිට මුහුදට මීටර් 150 ක් පමණ ඇත.

*විමසීම :*

මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් - 032-2254291
(වෙන්දේසිකරු - 076-323094)

ටී. එම්. සේනාරත්න,
අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු හා තක්සේරුකරු විශ්‍රාම ලත්,
අධිකරණ රෙජිස්ට්‍රාර්/පිස්කල්/ප්‍රොබේෂන් නිලධාරී මුළු දිවයිනටම සාමාදන විනිශ්චයකාර,
ජය මාවත නාත්තන්ඩිය පාර, මාරවිල.

01-159

# නොතාරිස් ලැයිස්තුව

## දැන්වීමයි

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

ගම්පහ මහාධිකරණ කලාපය තුල සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ රණතුංග ආරච්චිගේ ප්‍රේමවතී රණතුංග මහත්මියගේ 2020.03.01 වැනි දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම ගරු රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ
රාජ්‍ය අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ.

01-180

---

## දැන්වීමයි

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

අනුරාධපුර මහාධිකරණ කලාපය තුල සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ සිරිවෙට්ටි මොහොට්ටිගේ දාවිත් සිඤ්ඤෝ මහතාගේ 2020.11.11 වැනි දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම ගරු රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ
රාජ්‍ය අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ.

01-181

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

නුගවෙල, එඬරුතැන්න, අංක 27 දරන ස්ථානයේ පදිංචි අසීස් සාජිදා ෆයාසා වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ දමිළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 වැනි අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 07 වැනි වගන්තිය ප්‍රකාරව මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

අසීස් සාජිදා ෆයාසා.

2022 ජනවාරි 13 වැනි දින,
අංක 27,
එඬරුතැන්න,
නුගවෙල.

01-183

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි**

බාලසූරිය වීදිය, පෙරියකල්ලාර් 02, මඩකලපුව දරන ලිපිනයේ පදිංචි තංගරාජා විවේක්වන්දිරන් වන මම, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තංගරාජා විවේක්වන්දිරන්.

2022 ජනවාරි මස 12 වැනි දින,
බාලසූරිය වීදිය,
පෙරියකල්ලාර් 02,
මඩකලපුව.

01-185

# විවිධ දැන්වීම්

**ඈවර කිරීමේ නියෝගය (19 වන රීතිය)**

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය
(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

**සෙළින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ්**

මහාධිකරණ විනිසුරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා ඉදිරිපිට වර්ෂ 2020.07.30 වැනි දින ඉහත අංකය දරන නඩුව විවෘත අධිකරණයේ දී කැඳවනු ලැබූ අවස්ථාවේ දී 2007 අංක 07 දරන සමාගම් පනතේ ගණන් බේරා වසා දැමීමේ රීති යටතේ පහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීමට ගරු අධිකරණය නියෝග කර ඇත.

| | | |
|---|---|---|
| අධිකරණය | : | වාණිජ මහාධිකරණය, කොළඹ 12 |
| නඩු අංකය | : | CHC/45/17/CO |
| නියෝගය කළ දිනය | : | 2020/07/30 |
| සමාගමේ නම | : | සෙළින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | PV 3497 |
| සමාගමේ ලියාපදිංචි ලිපිනය | : | No. 171/1, First Floor, Galle Road, Colombo 04. |

**ඈවරකරු පත්කිරීම දැනුම්දීම (17 වන රීතිය)**

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය
(සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

**සෙළින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ්**

ඩබ්. ඒ. බී. විමලසිරි වන මම සෙළින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඈවරකරු වශයෙන් කොළඹ මහාධිකරණයේ පැවැත්වෙන නඩු අංක CHC/45/17/CO දරන නඩුවෙහි දී ගරු මහාධිකරණය විසින් පත් කොට ඇති බව මෙයින් දැනුම් දෙමි.

| | | |
|---|---|---|
| අධිකරණය | : | වාණිජ මහාධිකරණය, කොළඹ 12 |
| නඩු අංකය | : | CHC/45/17/CO |
| පත් කළ දිනය | : | 2021/10/28 |
| සමාගමේ නම | : | සෙළින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | PV 3497 |
| සමාගමේ ලියාපදිංචි ලිපිනය | : | No. 171/1, First Floor, Galle Road, Colombo 04. |
| ඈවරකරුගේ සම්පූර්ණ නම | : | විස්සහපුරගේ අමල් බුද්ධික විමලසිරි |
| ඈවරකරු ලිපිනය | : | එච්. ටී. පීරිස් සහ සමාගම, අංක 298 4/1, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 |

01-188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.